මගේ අංකය:ධීජදෙ /ආ02/04/ස.අ.කඩඉම්. වි
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව,
මාළිගාවත්ත,
කොළඹ 10

14 FEB 2025

2025.02. 14

අධ්‍යක්ෂ ( තොරතුරු තාක්ෂණ )

**ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත විධායක සේවා ගණයේ III වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා විභාග නිවේදනය වෙබ් අඩවියේ පළ කිරීම සම්බන්ධවයි.**

මෙම දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත විධායක සේවා ගණයේ III වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2025.02.27 වන දින ශ්‍රී ලංකා පරිපාලන ආයතනයේ දී පැවැත්වෙන අතර ඊට අදාළ විභාග නිවේදනය දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කිරීම සඳහා මේ සමග කාරුණිකව ඉදිරිපත් කරමි.

ආර්.ජේ.කෞශල්‍යා
සහකාර අධ්‍යක්ෂ (ආයතන)
ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

අභ්‍යන්තර නිවේදන අංකය - **DFAR/EST/2025/001**

## ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත විධායක සේවා ගණයේ III වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතාකඩඉම් විභාගය - 2024 (2025)

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා පරීක්ෂණය 2025.02.27 දින ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මඟින් පැවැත්වීමට තීරණය කර ඇත.

02. ඒ අනුව මෙම විභාගය සිංහල මාධ්‍යයෙන් පමණක් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේදී පැවැත් වීමට කටයුතු යොදා ඇති අතර පරීක්ෂණයට අදාළ විෂය නිර්දේශය සහ අනෙකුත් අදාළ විස්තර පහත පරිදි වේ .

2.1 විෂය කාලය සහ සමත් ලකුණු

| විෂය | විෂය අංකය | ලකුණු | කාලය | සමත් ලකුණු |
|---|---|---|---|---|
| 1.ආයතන සංග්‍රහය සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීති | 01 | 100 යි | පැය 1 1/2 | 40% |
| 2.මුදල් රෙගුලාසි හා රජයේ ප්‍රසම්පාදන කාර්ය පරිපාටිය | 02 | 100 යි | පැය 1 1/2 | 40% |
| 3.ඉංග්‍රීසි භාෂා දැනුම | 03 | 100 යි | පැය 1 ½ | 40% |

2.2 විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 01. ආයතන සංග්‍රහය සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීති | ආයතන සංග්‍රහයේ VII සිට IX දක්වා, XII සිට XVI දක්වා, XXIV, XXVIII, XLVII, XLVIII අංක දරණ පරිච්ඡේද හා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ අංක III, XII, XVII දක්වා පරිච්ඡේද |
| 02. මුදල් රෙගුලාසි හා රජයේ ප්‍රසම්පාදන කාර්ය පරිපාටිය | I සිට IV දක්වා XI, XIII, XIV දරණ පරිච්ඡේද හා චක්‍රලේඛ උපදෙස් සහ රජයේ ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ සමාන්‍ය දැනුම |

| | |
|---|---|
| 03. ඉංග්‍රීසි භාෂාව | LISTENING AND SPEAKING SKILLS<br>• General Greetings and Introductions<br>• Giving and Getting information<br>• Advising, Suggesting and Expressing Opinion<br>• Describing Events and Situations<br>• Telephone Skills<br>• Interviewing Skills<br>• Meeting<br>• Listening and Note Taking Skills<br><br>ENGLISH GRAMMAR<br>• Tense and Number<br>• Sentences(Simple/Compound/Complex/Compound Complex)<br>• Relative Clauses<br>• Reported Speech<br>• Adjectives and Adverbs<br>• Determiners<br>• Prepositions<br><br>WRITING SKILLS<br>• Internal Modes of Communication<br>• Formal Correspondence Skills<br>• Writing Descriptions/Explanations<br>• Summary Writing Skills<br>• Report Writing Skills<br>• Meeting Minutes/Agendas/Invitations<br>• Comprehension<br><br>READING SKILLS<br>• Reading and Understanding the Specific and General Meaning of a Printed text;<br>• Reading and Interpretation (Verbal / Written)<br>• Understanding the Cohesion and Coherence of a Passage. |

03. පළමුවන වරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතකුදු වුවත් ඉන්පසු වාරවලදී නිලධාරීන් විසින් ඉල්ලුම් කරන එක් විෂයයක් සඳහා රු.200 ක්ද, විෂයන් දෙකක් හෝ සම්පූර්ණ විභාගය සඳහා ඉල්ලුම් කරන්නේ නම් රු.500 ක්ද, වශයෙන් විභාග ගාස්තුව ගෙවිය යුතුය. එම විභාග ගාස්තුව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ආදායම් ශීර්ෂ 20-03-02-99 ට බැරවන ලෙස ප්‍රධාන කාර්යාලයේ සරප් අංශයට ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පතේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය. තව ද එහි ඡායා පිටපතක් ළඟතබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කවර කරුණක් යටතේ වුව ද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩ දෙනු නොලැබේ.

04. මෙම ලිපියේ ඇමුණුම I හි දැක්වෙන ආදර්ශ ආකෘතියට අනුව සකස් කළ අයදුම්පත් 2025.02.17 දිනට හෝ එදිනට පෙර **"අධ්‍යක්ෂ ජනරාල්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, මාළිගාවත්ත,කොළඹ 10"**යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලු කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"විධායක සේවා ගණයේ සහකාර අධ්‍යක්ෂ ( ධීවර හා ජලජ සම්පත්) III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2024 ( 2025)"** යනුවෙන් සඳහන් කළ යුතුය.

සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රය ලැබුණු බව දන්වනු නොලබන අතර, අයදුම්පත්‍රය හෝ ඒ හා සම්බන්ධ ලිපියක් හෝ තැපෑලේදී නැති වූ බවට කරන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. එබැවින් නියමිත දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ අයදුම්පත් එවීම අයදුම්කරුගේ වගකීම වේ.

**05.** පරීක්ෂණය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත. තමා පෙනී සිටින විෂයය සම්බන්ධයෙන් ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අයදුම්කරු විභාග ශාලාවේදී තම අනන්‍යතාවය තහවුරු කළ යුතු අතර මේ සඳහා පහත සඳහන් ලේඛනවලින් එකක් පමණක් පිළිගනු ලැබේ.

1. ජාතික හැඳුනුම්පත
11.වලංගු විදේශ ගමන් බලපත්‍රය
111.වලංගු රියදුරු බලපත්‍රය

සුසන්ත කහවත්ත
අධ්‍යක්ෂ ජනරාල්
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

සුසන්ත කහවත්ත
අධ්‍යක්ෂ ජනරාල්
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

2025.02. 13

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත විධායක සේවා ගණයේ III වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2024 (2025)

**Efficiency Bar Examination for the Grade III Officers in the Departmental Executive Service Category of the Department of Fisheries and Aquatic Resources -2024 (2025)**

විභාගය සඳහා පෙනී සිටින භාෂා මාධ්‍යය ☐

සිංහල -2

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1. සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..............................................................................................

..........................................................................................................................................

(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

2. අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම ( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) :

..........................................................................................................................................

(උදා : GUNAWARDHANA H.M.S.K.)

3. සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :..............................................................................................

..........................................................................................................................................

4. කාර්යාලයේ / දෙපාර්තමේන්තුවේ / ආයතනයේ නම හා ලිපිනය :

..........................................................................................................................................

..........................................................................................................................................

5. විභාග ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :

..........................................................................................................................................

..........................................................................................................................................

6. 6.1 ස්ත්‍රී/පුරුෂභාවය : ස්ත්‍රී - 1 පුරුෂ - 0 (අදාළ අංක කොටුව තුළ ලියන්න) ☐

6.2 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

6.3 දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐

6.4 උපන් දිනය : (වර්ෂය :මාසය :දිනය ) : ☐☐☐☐ ☐☐ ☐☐

6.5 විද්‍යුත් තැපැල් ලිපිනය:..............................................................................................

7. ඔබ විභාගයේදී ඉදිරිපත් වන විෂයය/විෂයන් (නිවේදනයේ පරිදි)

| අනු අංකය | විෂයය | විෂය අංකය |
|---|---|---|
| | | |
| | | |
| | | |

8. දැනට දරන තනතුර

8.1 තනතුර: ..............................................................................................

8.2 පත්වීම් ලිපියේ අංකය : ..............................................................................................

9. ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවටද ?

.............................................................................................................................................

9.1 විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තු :..................................

9.2 ලදුපත් අංකය : .................................................................................................................

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත් , විභාග ගාස්තුව රු. ..................... ප්‍රධාන කාර්යාලයේ සරප් අංශයට ගෙවා ලබා ගත් ලදුපත මෙහි අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

.................................                    ..........................................................

දිනය                    අයදුම්කරුගේ අත්සන

සටහන : තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවෙන් අත්සන් කිරීමට බලයලත් නිලධාරියකු ඉදිරිපිටදී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

### අත්සන සහතික කිරීම

මාගේ කාර්යාලයේ නිලධාරියකු/ නිලධාරිනියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන

.............................................................................................................................

මහතා/ මහත්මිය/ මෙනවිය ......................... වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ලබාගත් ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

..........................................................

සහතික කරන්නාගේ අත්සන හා නිල මුද්‍රාව

නම : ..........................................................................

පදවි නාමය : ..........................................................................

ලිපිනය : ..........................................................................

දිනය : ..........................